# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1830 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 11/12/2024<br>පැය 1615 |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. විදේශීය රටක නිෂ්පාදිත බෝර 12 වර්ගයේ ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තිරප්පනේ පොලිස් ස්ථානය.**

2024.12.11 වන දින අළුයම් කාලයේ තිරප්පනේ පොලිස් වසමේ උට්ටිමඩුව ප්‍රදේශයේදී තිරප්පනේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විදේශීය රටක නිෂ්පාදිත බෝර 12 වර්ගයේ ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන ගල්කුලම,තිරප්පනේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තිරප්පනේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බලන්ගොඩ පොලිස් ස්ථානය.**

2024.12.11 වන දින උදෑසන කාලයේ බලන්ගොඩ පොලිස් වසමේ රාස්සගල ප්‍රදේශයේදී බලන්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන රාස්සගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බලන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03.** **බලපත්‍ර නොමැතිව මැණික් ගැරූ සැකකරුවෙකු අත්අඩංගුවට - බගවන්තලාව පොලිස් ස්ථානය.**

2024.12.11 වන දින උදෑසන කාලයේ බගවන්තලාව පොලිස් වසමේ මෝරා වත්ත ප්‍රදේශයේදී බගවන්තලාව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව මැණික් ගැරූ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන බගවන්තලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බගවන්තලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **නිරුවත් ඡායාරූප හා වීඩියෝ සමාජ මාධ්‍ය වෙත මුදා හරින ලද සැකකරුවෙකු අත්අඩංගුවට - පරිගණක අපරාධ විමර්ශන වයඹ පළාත් ඒකකය.**

අන්තර්ජාලය ඔස්සේ නිරුවත් ජායාරූප සහ වීඩියෝ ප්‍රචාරය කිරීමක් සම්බන්ධව පරිගණක අපරාධ විමර්ශන වයඹ පළාත් ඒකකය වෙත කරන ලද පැමිණිල්ලක් මත විමර්ශන සිදුකර 2024.12.10 වන දින මුන්දලම පොලිස් වසමේ බත්තුළුඔය ප්‍රදේශයේදී එම සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 19 ක් වන බත්තුළුඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පරිගණක අපරාධ විමර්ශන වයඹ පළාත් ඒකකය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05.** **මාරක රිය අනතුරක් - මිහින්තලය පොලිස් වසම.**

2024.12.11 වන දින උදෑසන කාලයේ මිහින්තලය පොලිස් වසමේ පුත්තලම ත්‍රිකුණාමලය ඒ 12 මාර්ගයේ කුරුන්දන්කුලම ප්‍රදේශයේදී මිහින්තලය දෙස සිට අනුරාධපුර දෙසට ගමන් කල යතුරුපැදියක් අනුරාධපුර දෙස සිට මිහින්තලය දෙසට ගමන් කල ජීප් රථයේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදියේ පැදිකරු අනුරාධපුර ශික්ෂණ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 27 ක් වූ මිහින්තලය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මිහින්තලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**